මගේ අංකය:-
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය
සෞඛ්‍ය අමාත්‍යාංශය
''සුවසිරිපාය''
කොළඹ 10
2020.10. 24

සියලුම සෞඛ්‍ය ආයතන ප්‍රධානින් වෙත,

**<u>COVID 19 රෝගය පැතිර කාලය තුල දී රජයේ රෝහල් වලින් සායනික රෝගීන් සඳහා ඖෂධ සැපයීම.</u>**

COVID 19 රෝගය පැතිර යාම හේතුවෙන් දිවයින පුරා රෝහල් සායන පැවැත්වීමට අපහසුතා පැන නැඟි ඇත. එබැවින් එම කාලය තුල ඔබගේ රෝහලේ මාසික සායනයෙන්, ප්‍රතිකාර ලබන රෝගින්ට ඖෂධ ලබා දීම සඳහා වැඩ සටහනක් සෞඛ්‍ය අමාත්‍යාංශය හා තැපැල් දෙපාර්තුමේනතුව ඒකාබද්ධව ක්‍රියාත්මක කිරිමට රජය විසින් තීරණය කර ඇත. <u>දෙවන පියවර ලෙස හෙට සිට (2020.10.15)</u> කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්ක වලට අමතරව <u>කළුතර සහ කුරුණෑගල දිස්ත්‍රික්ක තුල</u> ඇති රෝහල වලින් ප්‍රතිකාර ලබාගන්නා රෝගීන්ගේ ඖෂධ නිවෙස් වෙත ලබා දීම ආරම්භ කෙරේ.

එබැවින් රෝහල සමීපයේ ඇති තැපැල් කාර්යාලයේ ප්‍රධානියා සමඟ සාකච්ඡා කර එම වැඩ පිළිවෙල සාර්ථක කර ගැනිම සඳහා පහත පියවරයන් අනුගමනය කරන ලෙස සියලුම සෞඛ්‍ය ආයතන ප්‍රධානීන් වෙත දන්වා සිටිමි.

1. මසකට/මාස දෙකකට ප්‍රමාණවත් ඖෂධ නොමැති, ඔබ රෝහල් සායනයේ ලියාපදිංචි, මාසිකව/ මාස දෙකකට බෙහෙත් ගන්නා, දුරකථනය මඟින් තහවුරු කර ගන්නා ලද සායනික රෝගීන්ගේ නිවස වෙත මසකට/මාස දෙකකට ප්‍රමාණවත් බෙහෙත් ලබා දීමට රෝහල සමීපයේ ඇති තැපැල් කාර්යාලයේ ප්‍රධාන නිලධාරි සමග කටයුතු කරන්න.
2. සායන පොත වෛද්‍යවරයා විසින් පරීක්ෂා කර, ඖෂධ වට්ටෝරුව නියම කල පසුව, අදාල කාර්ය මණ්ඩලය විසින් අදාළ බෙහෙත් පැකැට්ටු සකස් කරන්න. රෝගියාට අදාල නිවැරදි ඖෂධ නියමිත මාත්‍රාවෙන් ලබා දීම සඳහා දෙවරක් පරීක්ෂා කර බලන්න. <u>කිසිම විටක රෝගියා පරීක්ෂා නොකොට රෝගීන්ගේ බෙහෙත් වට්ටෝරුව වෙනස් නොකරන ලෙස අවධාරණය කරන්න.</u>
3. බෙහෙත් පැකැට්ටුවේ පිටත සායන අංකය, රෝගියාගේ නම, ලිපිනය සහ දුරකථන අංකය සමඟ ආයතනයේ නම පැහැදිලිව සඳහන් කරන්ත. රෝගියාට යම් විමසීමක් කල යුතු නම් එය ඉටු කර ගැනීම පිණිස ඔබගේ ඖෂධ සංයොජක / ඖෂධවේදී ගේ දූරකථන අංකය ද පැකට්ටුවේ සඳහන් කරන්න.
4. බාරදිය නොහැකි නම් නැවත රෝහලට එවන ලෙසද තැපැල් කාර්යාලයේ ප්‍රධාන නිලධාරියාට දන්වන්න. ඒ සඳහා රෝහලේ නම ද සඳහන් කරන්න.
5. ඖෂධ පැකැට්ටුවේ ඇති පරිදි නම සහ සායන අංකය සඳහන් නාම ලේඛණ දෙකක් සකස් කර එම පැකට්ටු සමඟ, තැපැල් කාර්යාලය වෙත යවන්න. තැපැල් කාර්යාලය භාර ගත් බවට අත්සන තැබීමෙන් පසු එක් පිටපතක් ඔබ කාර්යාලයේද අනෙක් පිටපත තැපැල් කාර්යාලයටද ලබා දෙන්න.

6. ඇතැම් ඖෂධ හිරු එළියට හා තාපයට සංවේදී වන බැවින් ඖෂධ ප්‍රමිතිය ආරක්ෂා වන පරිදි අසුරණ සකස් කර ගැනීමට පියවර ගන්න.

7. අවශ්‍ය පරිදි මුඛ ආවරණ, අත් ආවරණ සහ අත් පිරිසිදු කිරීමේ දියර තැපැල් කාර්ය මණ්ඩලය වෙත ලබාදීමට කටයුතු කරන්න.

8. මෙම ක්‍රමවේදය ක්‍රියාත්මක කරන කාලය තුල තුල ඖෂධගාරයෙන් නිකුත් කරන ඖෂධ සඳහා තොග වශයෙන් ගනන් තැබීමේ ක්‍රමය අනුගමනය කිරීමට උපදෙස් දෙන්න.(Bulk accounting method)

9. අධික සායනික රෝගීන් ප්‍රමාණයක් සිටින රෝහල් සඳහා ඖෂධ පැකට් සකසන කාර්යය මණ්ඩල පැය 24 පුරා සේවයේ යොදවා ගැනීමට අවශ්‍ය වන්නේ නම්,සේවා අවශ්‍යතාවය අනුව කාර්යය මණ්ඩල සේවයේ යොදවා ගැනීමේ බලය ආයතන ප්‍රධානියා වෙත පැවරෙනු ඇත.

10. ඖෂධ සුරක්ෂිතව ඇසුරුම් කිරීම සඳහා ප්‍රමාණවත් සුදුසු ඇසුරුම් ලබා දීමට කටයුතු කරන්න.

11. යම් රෝගියෙකු බෙහෙත් ලබා ගන්නේ වෙනත් දුර බැහැර පිහිටි රෝහලකින් නම්, ලගම ඇති රෝහලට රෝගියා ලග ඇති සායනික පොත යවා ආයතනික ප්‍රධානියා වෙත යොමු කරන්න. එවිට එම ආයතන ප්‍රධානියා විසින් රෝගියා බෙහෙත් ගන්නා ස්ථීර අදාල රෝහල වෙත දුරකථන ඇමතුමක් ලබා දී විමසා බලා තහවුරු කරගෙන ඖෂධ ලබා දීමට කටයුතු කරන්න.

12. ප්‍රදේශයේ පවුල් සෞඛ්‍ය නිළධාරීන්, මහජන සෞඛ්‍ය පරික්ෂක සහ ග්‍රාම නිළධාරීන් වෙත ඔබගේ රෝහලේ දුරකථන අංකය ලබා දී, සායනික රෝගීන් වෙත එම අංකය දැනුම් දෙන ලෙස දන්වා සිටීම මඟින්, ඖෂධ ලබා ගැනීමට අවශ්‍ය වන රෝගීන්ගේ නිවරදි තොරතුරු ඔබ රෝහලට ලබා ගත හැකි වනු ඇත.

13. සියළුම පලාත් සෞඛ්‍ය හා ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරුන් සහ රෝහල් ප්‍රධානීන් මෙම ක්‍රියාවලිය නිරන්තර අධීක්ෂණය කර ඵලදායි ලෙස ක්‍රමවත් වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට වග බලා ගත යුතුය. එකතුකර ගන්නා රෝගීන් ගේ නවතම තොරතුරු නිසි පරිදි ලේඛනගතකර තබා ගන්න.

මෙම අවධානම් අවස්ථාවේ දී, රෝගී ජනතාව, රෝහල තුල එක් රැස් වීම අවම කර ගනිමින් රෝගීන්ට සිදුවන අපහසුතා වැලැක්වීම සඳහා රජය විසින් යොජනා කරන ලද මෙම ඒකාබද්ධ වැඩසටහන සාර්ථක කර ගැනිම සඳහා ඔබ සියලු දෙනා දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

විශේෂඥ වෛද්‍ය එස් ශ්‍රීධරන්
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :-

01. ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය
02). තැපැල්පති තුමා
03). සියලුම පලාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරුන්
04. සියලුම ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරුන්